# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2401/22 – 2024 සැප්තැම්බර් මස 12 වැනි බ්‍රහස්පතින්දා – 2024.09.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2013 ඔක්තෝබර් මස 04 වැනි දින අංක 1830/51 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2013 අංක 298 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සංචාරක හා ඉඩම් අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 වැනි උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

රනිල් වික්‍රමසිංහ,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4/3/10/2012/LRB/221.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය: WGSWD&EIP/ACQ/KB/13.

2024 සැප්තැම්බර් මස 11 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 577, වේරහැර උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වේරහැර (කොට්ඨාස අංක 6, වේරහැර, බොරලැස්ගමුව නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/KSB/2024/89 හා 2024.05.30 දිනැති අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර **'A'** – **දෙල්ගහඹිවිට, දෙනියවත්ත සහ කදුරුගහකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.2196**

උතුරට: මූ.පි.කො 9594 කැබලි අංක 50, 52, අසෝක පෙරේරා හිමිකම් කියන මැටිශුද්ධාගාර පාරේ වරි. අංක 175/4 දරන ඉඩම සහ එච්. ඒ. නිහාල් හිමිකම් කියන මැටිශුද්ධාගාර පාරේ වරි. අංක 174/3 දරන ඉඩම; නැගෙනහිරට: අසෝක පෙරේරා හිමිකම් කියන මැටිශුද්ධාගාර පාරේ වරි. අංක 175/4 දරන ඉඩම සහ එච්. ඒ. නිහාල් හිමිකම් කියන මැටිශුද්ධාගාර පාරේ වරි. අංක 174/3 දරන ඉඩම; දකුණට: එච්. ඒ. නිහාල් හිමිකම් කියන මැටිශුද්ධාගාර පාරේ වරි. අංක 174/3 දරන ඉඩම, කැබලි අක්ෂර B සහ මූ.පි.කො 9594 කැබලි අංක 53; බටහිරට: කැබලි අක්ෂර B, මූ.පි.කො 9594 කැබලි අංක 53 සහ 50.

EOG 09 – 0096



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*